


# හුරු - නුහුරු



ලැබුවේ අවුරුදු මාසේ. අපේ උදවිය එහෙත් හරි හරියට අවුරුද්දට සූදානම. මෙහෙත් එහෙමයි. අවුරුදු උත්සව හරියටවත්. මාසේ පිරෙන්නම. අපේ තුන් දෙනාටත් සුපුරුදු විදියට ම මේ කාලේ ටිකක් කලබලයි. අවුරුදු උත්සවවලට එහෙ මෙහෙ දුවන හන්දා.

"අවුරුද්දට ගමේ ඉන්න තිබුණානම් තමයි ඉතින් හොඳ." පැන්සලට ඉබේටම කියවුණේ අවුරුදු උත්සවයකට ගිහින් ඇවිත් මහන්සියට ද කොහෙද ?

"අපිට මඟ ඇරෙන දේවල් ගැන මතක් වෙන-කොට නම් හරිම සාංකාවක් තියෙන්නේ....." පින්සලත් ඇඳි පුටුවට හරි බරි ගැහුනා.

"ඒ සාංකාව මග ඇරගන්නත් එක්ක තමයි මෙහේ ඉන්න උදවිය මේ තරම් වෙහෙස මාංසි වෙලා මේ උත්සවය සංවිධානය කරන්නේ." පන්හිඳ කිව්වා. "පොල්ගෑමේ තරඟයට හිරමණ ටිකක් හොයා ගන්න එක ම මොන තරම් අමාරු ද?"

"ඇයි අපට අපිට නුහුරු මිහිරක් විඳින්න බැරි ? අපේ ම නොවුණත් අනික් අයගේ දේවල්වලත් මිහිරක් තියෙන්න පුළුවන්."

"බටහිර පන්නෙට ඇඳපු "ඇබ්ස්ට්‍රැක් " චිත්‍රයකට කැමති කෙනෙක් අපේ පන්සල් චිත්‍රයකට කැමති වෙයි ද? ඒ පාට සංකලනයට කැමති වෙයිද ? අපේ රටේ ගහකොළවල තියෙන දීප්තිමත් කොළ පාටට අපි කැමති. ඒත් මේ රටේ ගහකොළවල තියෙන අව පැහැ ගැණුණු කොළ පාට තමයි මෙහේ අය තමන්ගේ චිත්‍රවලට යොදා ගන්න වැඩියෙන් කැමති." පින් තමන් දන්නා දේ ගැන කතා කළේ තමන්ගේ අත්දැකීම් එක්ක.

"පන්සල් චිත්‍ර රටාවයි ඇබ්ස්ට්‍රැක් රටාවයි එකතු කරලා චිත්‍රයක් ඇන්දොත් ?" පන්ට ඉබේටම ඇහුණා.

"ඒක නව නිර්මාණයක් වේවි. !" පින් හිනා වුනා.

"අළුත් කලාවක් වේවි ! පැන්සලත් ඒ සිනාවට එකතු වුණා."

"ඇයි පොල් ?" පින්ට ඉබේටම කියවුණා.

"පිටිං තමයි පොල් ගේනන වෙන්නේ...."

"ඔන්චිලි වාරම්, රබන් පද ඇහෙනකොට හිතට දැනෙන සතුට වෙන මොනවයිනද ලැබෙන්නේ ?

"ඔන්චිලි නං මෙහෙත් ඔය "පාර්ක් " වල ඕන තරම් තියෙන්නෙ....." ඒවා පදිනකොට ඇහෙන යකඩ එකට ඇතිල්ලෙන සද්දෙයි කඹ වලින් බැඳපු ඔන්චිල්ලාවකින් එන කිටි - කිටි සද්දෙයි අතරෙ තියෙන්නෙ මොන වෙනසක් ද ඇත්තටම ? අපිට හිතට දැනෙන්නෙ අර පුරුදු කඹෙන් එන් කිටි කිටියනේ......

"හැම දේක ම මිහිර හිතට දැනෙන්නෙ අපි ඒ දේට හුරු වෙලා තියෙන හැටියට. මෙහෙ උපන් කෙනෙකුට යකඩවල ගොරහැඩි හඬ කොහුවල කිටි කිටියට වඩා මිහිරි වෙන්න පුළුවන්." පැන් අදහසක් දාලා බැලුවා.

"මතකද ප්‍රදීප් රත්නායක සිතාර් වාදන විශාරද-වරයා මෙහෙ පවත්වපු ප්‍රසංගය ? සිතාරයෙන් වාදනය කරන සංගීත කොටස් අපේ ජන ගී වගේමෙ සරළ ගීත් මුල් කරගෙන නිර්මාණය කරගත්ත ඒවා. ඒ වුණාට රත්නායක මහත්තයාට එකතු වුණ ලෝක ප්‍රසිද්ධ ජෑස් වාදකයා, වයලින් වාදන ශිල්පිනිය වගේම අනික් පිරිස ඒවා තමන්ගේ කරගෙන අපූරු සංධ්වනි වාදනය කළා. බලන්න ඇවිත් හිටිය අයගෙන් බාගෙට බාගයක් සුදු අය. ඒ අය හැම සංගීත අංගයක්ම ඉවර වෙනකොට අත්පොළසන් දුන්නේ නැගිටල වාදකයින්ට ගෞරව කරලයි. හැමෝම එක විදියට විඳපු ප්‍රසංගයන් ඒක." පන්හිඳ ආයෙමත් සංගීත මාතෘකාවට ආවා.

"ඕනම කලාවකට වැදගත් වෙන්නේ ඒ නිර්මාණ කරපු අයගේ අවංක කම. නිර්ව්‍යාජව හදවතින් ම කරන ප්‍රකාශනයක නිර්මල බව එළියට එන්නෙ නිරායාසයෙන්. ඒ සුන්දර බව රසිකයින්ට ඉබේ ම දැනෙනවා.

"දැක්කද මං "ෆේස් බුක් " එකේ ෂෙයාර් කරපු වාදන ?"

පැන්සල තවත් පැත්තකට කතාව හරවන්නයි හදන්නේ.

"ඒ වාදනවල තියෙන සුන්දරකම, ඒවාට එකතු වෙලා තියෙන තරුණ ජවය නිසා තවත් වැඩි වෙනවා. ඒත් ඒකෙන් කියවෙන්නේ නෑ රවි ශංකර් මහත්තයගේ සිතාර් වාදනයත් සුන්දර නෑ කියලා. මොකද නියම කලාකාරයෙක් වයසට යන්නේ නැති හින්දා. ජෝ අබේවික්‍රම මහත්තයා රඟපාපු වැඩිහිටි චරිතවලත් ඒ නිර්මල සුන්දර්තවය අපූරුවට තිබුණා." ඒ පන්.

"අපි කවදාවත් අහලා නැති "යුකුලෙලේ ", "හාෆ් " වාගේ සංගීත භාණ්ඩ හරියාකාරව වාදනය කරනකොට මොන මිහිරක්ද දැනෙන්නේ."

"හැබැයි ඉතින් හරියට වාදනය කරන්න ඕන." පැන් විහිළුවං වගේ කිව්වා. "මිහිරට වාදනය කරන්න ඕන."

"තාක්ෂණය හින්දා අපට හොඳ දේවල් තෝරා බේරාගෙන අහක බලන්න ලැබෙන එක හරි වටිනවා."

"ඒක තමා ෆේස් බුක් එකේ "යුකුලෙලේ " භාණ්ඩය සෙල්ලම් කරනවා දැකලා මාත් ගත්තා එකක්." ඒ පන්.

"බර වියදම් ඇති !" පැන් ඇහුවේ ඔලොක්කුවට වගේ.

"නෑ "කෑෂ් කන්වර්ටර්ස් " ලා ගාව ලාබෙට තිබුණා. ඉතින් මං ගත්තා පොඩ්ඩක් ට්‍රයි කරලා බලන්න."

"දැන් එහෙනං යුකුලෙලේ උගන්වන පන්ති එහෙමත් යන්න වේවි. "හෝම්ස් ගෙලන් ටේෆ් " එකේ හය මාසේ "කෝස් " එකක් "ඇඩ්වටයිස් " කරලා තියෙනවා මං දැක්කා. පැන්ගේ කතාව භාගෙට භාගයක් ඉංග්‍රීසි.

"අනේ එහෙම විය හියදං කරන්න මට බැරි වෙයි. මං මොකද කළේ. යුකුලෙලේ එකේ වයර් හතර වයලින් එකේ විදියට "ටියුන් " කරගත්තා. ඉන්න ගමං ඔය සිංදුවක්වත් ගහන්න පුරුදු වෙන්න. ඇඟිලිවලින් වාදනය කළ හැකිනේ......" පන් අහිංසක හිනාවක් දැම්මා.

"ඒක තමා රෑට රෑට කාමරේ පැත්තෙන් "ටං" "ටිං" "ටුං" අඬක් අවේ. පින්ට හිනා. "සිංදුවක් විදියටනං ඇහුනෙ නෑ."

තමන්ට විඳින්න පුළුවන්නම් පොඩි දෙයක් වුණත් ඇති. ඇත්තටම හිතට හරි පුදුම අස්වැසිල්ලක් ලැබෙන්නෙ ඒ වැඩෙන් තමං දන්න දෙයක් වාදනය කරන්න උත්සාහ කරලා යන්තං හරි ටිකක් අල්ලගත්තම හිතට දැනෙන්නෙ හරි සතුටක්. කාටවත් කරදරයක් නැතිව ලැබෙන අහිංසක සතුටක්."

"ඒ විදියට තමංගෙ පාඩුවේ සතුටු වෙන කොයි තරම් කට්ටියක් තවත් අපි අතරේ ඇද්ද ? පන් ඇහුවේ අනුකම්පාවෙන් වගේ.

**සන්නස මංගල යෝජනා**

**මුල් වචන 40 සඳහා මාසයකට අයකිරීම ඩොලර් 30**
**පහත දැක්වෙන ගිණුමට මුදල් බැර කර එම ලදු පත සමග ඔබේ දැන්වීම අපට එවන්න** sannasanews@gmail.com

**Account Name - Sannasa Media**
Bank - Westpac
BSB Number - 033 341
Account Number - 590847

αlpha academy
Classes at Dandenong
Selective entry school exam preperation
Primary, Secondary, VCE
2015 Program
Primary & Secondary - Mathematics, Science and English
VCE - Biology, Chemistry
VCE English - Recommended Texts Analytical Writing
Classes conducted by Current School Teachers
Contact - Sarah on 0457 908 918
ABN 52267352093

සුභාවිත ගීතයේ අන්තර්ජාල නවාතැන - තිසර ගුවන්විදුලිය www.thisara.com